මහින්ද ජයසිංහ,
විධායක සභික,
ජාතික ජන බලවේගය,
154/යක්කල පාර,
ගම්පහ.

පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

ගරු පොලිස්පතිතුමනි,

**<u>ජාතික ජන බලවේගය ගම්පහ දිස්ත්‍රික් සමුළුවට 2022 ජනවාරි 30 දින කලගෙඩිහේනේදී එල්ල වූ මැර ප්‍රහාරය සම්බන්ධව කරනු ලබන ලිඛිත පැමිණිල්ලයි</u>**

උක්ත මැර ප්‍රහාරයට අදාළව ප්‍රසිද්ධියට පත් සියලු සිදුවීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ඔබතුමා දන්නවා ඇතැයි යන පූර්ව නිගමනය මත පහත කරුණු ඔබතුමාගේ අවධානයට ලක් කරනු කැමැත්තෙමි. විශේෂයෙන්ම ඉහත සඳහන් ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් සමුළුව පවත්වන්නට යෙදුනේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුළත් භාෂණයේ හා ප්‍රකාශනයේ මෙන්ම සාමකාමීව රැස්වීමට ඇති අයිතිය ඇතුළත් 14(1) වගන්තිය පෙරදැරි කරගෙන බව පෙන්වා දෙමි. එහිදී ඉතාමත්ම සංවිධානාත්මක මැර කල්ලියක් විසින් එකී සාමකාමී සමුළුවට මැර ප්‍රහාරයක් එල්ල කරමින් එම රැස්වීම කඩාකප්පල් කිරීමට උත්සාහ කළ අතර එහි රැස්ව සිටි සාමාජිකයන් එම මැර පිරිසෙන් දෙදෙනෙකු අල්ලා ගැනීමට සමත් වී ඇත. ඔවුන් දැනට පොලිසිය භාරයේ සිටී. ඒ අනුව මහගෙදර විජයආරච්චිලාගේ රත්මල් අසිත කුමාර විජේරත්න හෙවත් ගේබ්‍රියල් රත්මල් අසිත කුමාර සහ ආනන්ද බණ්ඩාර යනුවෙන් දෙදෙනෙකු දැනටමත් හඳුනාගෙන ඇත.

ඔවුන් විසින් කරන ලද පාපොච්චාරණ මත සහ හෙළිදරව් කිරීම්වලින් පෙනී යන මූලික කාරණයක් වන්නේ මෙම මැර ක්‍රියාව හුදෙක් ඉහත පුද්ගලයන්ගේ ඕනෑ එපාකම්වලට සිදු වූවක් නොවන බවත් එය ඉතාමත්ම සංවිධානාත්මක කල්ලි කණ්ඩායමක සැලැස්මක් මත හුදෙක් පෞද්ගලික දේශපාලනික වුවමනාවන් මුදුන් පමුණුවා ගැනීමේ චේතනාවෙන් සිදුකරන ලද්දක් බවත්ය. ඒ අනුව ඔවුන්ගේ වාචික හෙළිදරව් කිරීම්වලදී අනාවරණය කොට ඇත්තේ ඔවුන් ඇවන්ගාඩ් සමාගමේ සේවය කරන බවත් ප්‍රසන්න රණතුංග කැබිනට් අමාත්‍යවරයාගේද අනුදැනුම හා අභිලාශය මත මෙම මැර ප්‍රහාරය සිදු කර ඇති බවත්ය. ඉහත තත්වයන් තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 124 වගන්තියේ ඇතුළත් ප්‍රතිපාදන පදනම් කරගෙන සීසීටීවී කැමරා දර්ශන, දුරකථන ඇමතුම් දත්ත, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල ඇතුළත් දර්ශන හා පුවත්පත් වාර්තා මෙන්ම විද්‍යාත්මක සාක්ෂි සම්පිණ්ඩනය කර ගනිමින් නිසි නිගමනයකට එළඹීමට හැකියාවක් ඇති බව පෙන්වාදෙනු කැමැත්තෙමි.

මෙහිදී හෙළිදරව් වී ඇති කරුණු අනුව සෘජුවම ඇවන්ගාඩ් සමාගමට සම්බන්ධව සේවය කරන සේවකයන් මෙම සිද්ධියට සම්බන්ධ වීමෙන් පෙනී යන්නේ සිදුකරන ලද වරද ඉතාමත් භයානක තත්වයකට ඇදවැටෙන බවයි. මන්ද එම සමාගම ක්‍රියාත්මක වන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන අතර එම සමාගමේ සේවකයන් ගිනි අවි සහ වෙනත් ආයුධ සහිතව ක්‍රියාත්මක වන පිරිසකි. එකී ගිනි අවි යම් අවස්ථාවකදී සමාගම සහ ආරක්ෂක අමාත්‍යාංශය බලාපොරොත්තු වන අරමුණෙන් පරිබාහිරව වෙනත් අරමුණක් ඉටුකරවා ගැනීම සඳහා යොදා ගැනීමට මෙම මැර ප්‍රහාරය වැනි සිදුවීම් මගින් ඇති හැකියාව ඉතාමත් වැඩි බව සඳහන් කරනු කැමැත්තෙමි. මන්ද මෙම ප්‍රහාරය හුදෙක් බිත්තර යොදාගනිමින් සිදු කළද යම් අවස්ථාවකදී අත් බෝම්බ සහ ගිනි අවි යොදාගැනීමට ඇති ඉඩකඩ බොහෝ ඇති බව පෙනී යන කරුණකි. එමගින් සෘජුව බලපෑමක් ඇතිවන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට බව ඔබගේ අවධානයට ලක්කර සිටිමි.

විශේෂයෙන් දණ්ඩනීති සංග්‍රහයේ 100 සහ 101වන වගන්ති මගින් මෙවැනි අපරාධවලට ආධාර හා අනුබල දෙන තැනැත්තන් මූලික වරද කළ පුද්ගලයන් හා සමානව සැලකේ. එසේම මෙම අපරාධයේ හෙළිදරව්වීම් මත දණ්ඩ නීති සංග්‍රයේ ඇතුළත් 113(අ) වගන්තියේ ඇති කුමන්ත්‍රණය යන අපරාධමය වරද මත පදනම්ව මෙම අපරාධයේ මුල සිට අග දක්වාම දම්වැලක පුරුක් සේ පරීක්ෂා කිරීමේ හැකියාව ශ්‍රී ලංකා පොලීසියට හැකියාවක් පවතින බවත් එමගින් ඇවන්ගාඩ් සමාගමේ සහ සෘජු දේශපාලන අධිකාරියේ ඇති මැදිහත්වීම හෙළිදරව් කරවා ගැනීමට හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි.

එසේම දණ්ඩනීති සංගහ්‍රයේ 340 සහ 341වෙනි ඡේදවල ඇතුළත් සාපරාධී බලහත්කාරයන් 484 ඡේදයේ ඇතුළත් සාපරාධී බියගැන්වීම, නින්දා කිරීම හා අප්‍රසන්නතාවයක් ඇති කිරීම නැමති වරදවල් ගණයටද උක්ත මැර ක්‍රියාව සෘජුවම හේතු වනු ඇති බවද ඔබතුමා වෙත පෙන්වාදෙනු කැමැත්තෙමි.

ලැබී ඇති තොරතුරු අනුව මෙම මැර ක්‍රියාව සිදුකරන ලද අපරාධකරුවන් හට දඬුවම් කරනවා වෙනුවට ඔවුන් නීතියේ රැහැනට හසුකර දුන් සාමකාමී පුද්ගලයන් පසුපස විවිධ කටඋත්තර ප්‍රකාශ ලබාගනිමින් එම පුද්ගලයන් අපහසුතාවයකට පත්කරමින් පවතින බව මාහට දැනගන්න ලැබී ඇත. එමගින් මෙම පරීක්ෂණ වෙනත් පැත්තකට යොමු කිරීමේ ප්‍රවණතාවයක් පවතින බවද පෙනී යයි.

මා වැඩිදුරටත් කියා සිටින්නේ, සැබෑ අවශ්‍යතාවයක් වේ නම් සෘජු සාක්ෂි, පරිවේශනීය සාක්ෂි සහ විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගෙන ශ්‍රී ලංකා පොලීසියට මෙම වරදෙහි දාමය මුල සිට අග දක්වා ඉතා පහසුවෙන් විමර්ශනය කොට නිගමනයකට පැමිණීමට ඕනෑතරම් පහසුකම් සහ ඉඩකඩ ඇති බවයි. එබැවින් ජාතික ජන බලවේගයේ විධායක සභිකයෙකු ලෙස මෙම අනීතික කටයුත්තෙහි සාධාරණත්වය පිළිබඳව ඉතා සුපරික්ෂාකාරීව බලා සිටින බවත් එසේ සිදු කිරීමට ඔබ පොලීසිය අපොහොසත් වන්නේනම් හෝ පැහැර හරිනු ලබන්නේ නම් නීත්‍යානුකූල රාමුව තුළ ගත හැකි සෑම ක්‍රියාවක්ම ගැනීමට ජාතික ජන බලවේගය පසුබට නොවන බවත් වැඩිදුරටත් ඔබතුමා වෙත මතක් කරනු කැමැත්තෙමි.

ස්තුතියි,

මෙයට,

විශ්වාසී,

මහින්ද ජයසිංහ
ජාතික විධායක සභික
ජාතික ජන බලවේගය
2022.02.02